**අනුරාධපුර මහා නගර සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**

---

**01 මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 01 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 16 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ කඩ කුලී ලේඛනය අනුව වාර්ෂික බදු කුලිය රු.19,288,309 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එම අගය රු.25,234,179 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබෙන ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් එකතුව රු.9,344,384 ක් වූ වාහන 16 ක් සභාව සතුව නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මධ්‍යම පරිසර අධිකාරිය මගින් පිළිසරු ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබුණු එකතුව රු.7,600,000 ක් වූ වාහන 02 ක් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අනුරාධපුර මහා නගර සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.131,050,243 ක් වූ අතර,ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.50,146,300 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 වරිපනම් බදු**

2015 දෙසැම්බර් 31 දනට හිඟ වරිපනම් බදු රු.78,550,122 ක් 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනතේ 242 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.2.2 කඩ කුලී**

2015 දෙසැම්බර් 31 දිනට හිග කඩ කුලී රු.42,819,703 ක් අය කර ගැනීමට කුලී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.3 වෙනත් ආදායම්**

සභාව සතු කුඹුරු ඉඩම් අක්කර 39, පර්චස් 72 ක් බාහිර පාර්ශවයන් විසින් වගා කටයුතු සඳහා යොදා ගන්නා බව අනාවරණය වූ අතර, එම කුඹුරු ඉඩම් හඳුනාගෙන එළදා බදු අය කර ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

**03 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දෛනික කටයුතු සඳහා ධාවනය වන වාහන 07 ක වටිනාකම හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2001 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලැබී තිබුණු එකතුව රු.876,926 ක් වූ අගරු චෙක්පත් 59 කට අදාල මුදල් අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි.

(ඇ) වර්ෂ 10 කට පමණ අදාළ වන රු.2,778,162 ක්වූ ගෙවිය යුතු විගණන ගාස්තු 2016 මැයි 27 දින වනතුරුත් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මහා නගර සභාවට අයත් ඇතැම් ඉඩම්/ගොඩනැගිලි හඳුනාගෙන ඒවායේ වටිනාකම් තක්සේරු කර ස්ථාවර වත්කම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) පොදු තැන්පත් ගිණුමේ දැක්වෙන රු.8,638,381 ක්වූ වසර දෙකක කාලයක් ඉක්මවා තිබෙන තැන්පතු හඳුනාගෙන ආදායමට බැර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(ඊ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව සභාව සතුව පවත්නා රු.5,815,880 ක්වූ පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

-----------------------------

**නිශ්ක්‍රීය වත්කම්**

---------------------

(අ) මූලා‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණු එකතුව රු.4,130,000 ක් වූ වාහන 03 ක් සමාලෝචිත වර්ෂය තුළ ආදළ කාර්යයන්වල යොදා ගැනීමකින් තොරව නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) මූලා‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ වටිනාකම් ඇතුළු විස්තර දක්වා නොතිබුණු වාහන 05 ක් අදාළ කාර්යයන්වල යොදා ගැනීමකින් තොරව නිශ්ක්‍රියව පැවතුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

-----------------------------

(අ) මහානාම උයන 8 වනපටුමග අවසන් කොටසේ මීටර් 307 ක් ගල් අතුරා තාර දැමීමට රු.1,094,790 ක් 2015 සැප්තැම්බර් මස වැයකර තිබුණි. 2016 මැයි 20 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදී එම ගල් අතුරා තාර දමා තිබුණු කොටසේ වැඩි ප්‍රමාණයක මාර්ගය ඉරිතලා ගල් ගැලවී මාර්ගය ගිලාබැස තිබුණි. එම තත්ත්වය තුල ව්‍යාපෘතියේ කාර්යයන් නිසි ප්‍රමිතියට සිදුකර නොමැති බව නිරික්ෂණය විය.එසේම වැඩ විෂයය අංක 3.1 සහ 3.2 යටතේ මාර්ගයේ උරහිස සකස් කිරීම සඳහා බොරළු සන මීටර් 26.99 ක් සපයා මාර්ගයේ දෙපස ඇතිරීමට රු.47,826 ගෙවා තිබුණද අදාළ කාර්ය සිදුකර නොතිබුණි.

(ආ) පන්ඩුකාභයපුර 8 වන පටුමග මීටර් 389 ගල් අතුරා තාර දැමීමට රු.1,616,699 ක් ගෙවීම් කර තිබුණි. ක්ෂේත්‍ර පරික්ෂාවේදී ලබාගත් මිනුම් අනුව ගල් අතුරා තාරදමා තිබුණු දුර මීටර්373 ක් විය. ඒ අනුව තාර නොදැමූ මිටර් 16 ක් සඳහා රු.57,162 ක් වැඩිපුර ගෙවා තිබුණි. නිසි ප්‍රමිතියට සහ අධීක්ෂණයකින් තොරව කාර්යයන් සිදු කිරීම නිසා තාර දමා තිබුණු කොටසේ වැඩි කොටසක් ඉරිතලා පාර ගිලාබැස ගල්ගැලවීමට ආසන්න තත්ත්වයේ තිබු බව 2016 මැයි 20 දින කරන ලද භෞතික පරික්ෂාවේදී අනාවරණය විය.

(ඇ) රත්නායකපුර II වන පටුමග අවසන් කොටසේ මීටර් 128 ක් තාර දමා සංවර්ධනය කිරීමට රු.1,279,510 ක මුදලක් 2016 පෙබරවාරි මාසයේදී ගෙවා තිබුණි. 2016 මැයි 20 දින සිදු කළ ක්ෂේත්‍ර පරික්ෂාවේදී රු.142,536 ක අධිගෙවීමක් සිදුකර තිබුණු බව නිරික්ෂණය විය.

**04. පද්ධති හා පාලනය**

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය